# පිරිවෙන් අධ්‍යාපනයෙන් පෝෂණය ලත් පඬිවරු

පුස්ස්වෙල්ලබණ්ඩාර සන්නස්ගල මහතා

මෙරට අධ්‍යාපනයේ ඉතිහාසය මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කර බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්‍ය්‍යය සිදු වූ අවස්ථාව කරා ගමන් ගනී. ඒ වනාහි බුද්ධ වර්ෂයෙන් තුන්වන සියවස වේ. ලංකාව පිළිබඳ ඉපැරණිවූත් තථ්‍යවූත් තොරතුරු ඇතුළත්ව ඇත්තේ එදා උන්වහන්සේ විසින් මේ රටට ගෙන එන ලද පාලි ථෙරවාදී බුද්ධ ධර්මය ඇතුළත්ව පසුව පාලි භාෂාවට සංගෘහිත වූ පොත්වලයි. මේ පොත් පෙළේ ඇතුළත් ධර්මය තුන්වන සංගායනාවෙන් පසු ලංකාවට මිහිඳු මහ හිමියන් විසින් ගෙනා බව ඉතිහාසගත සත්‍යයකි. ලංකාවේ ඉපැරණි සාහිත්‍යය ගැන දැක්වෙන පළමු සටහනකි මෙය.

පාලි නමින් හැඳින්වෙන භාෂාව අද පොතට පමණක් සීමා වී පවතින මළ බසක් හැටියට සැලකෙයි. එය පැරණි ඉන්දියාවේ මගධ ප්‍රදේශයේ ව්‍යවහාර වූ ප්‍රාකෘත විශේෂයක් මුල්කොට පවතී. බුදුරජාණන් වහන්සේ මගධ ප්‍රදේශයේ ජනිත වූ කෙනකු වූ හෙයින් උන්වහන්සේගේ ධර්මය ඇතුළත් භාෂාව ද මගධ කියා නම් ගැනී ඇත. ථෙරවාද භික්ෂූහු මගධ භාෂාව බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇතුළත් වූ ශුද්ධ භාෂාව කොට සලකති. එය තුන්වන ධර්ම සංගායනාවෙන් පසු ථෙරවාදී භික්ෂූන් විසින් පාලි නමින් හඳුන්වනු ලැබූ බව පෙනේ. එම දහම් මග ලංකාවේ පමණක් ශේෂව පැවති බව පසු කල භාරතීය ථෙරවාදී භික්ෂූන්ගේ විශ්වාසය විය.

මහාවංස පුවත්හි සඳහන්වන පරිදි මිහිඳු මහ රහතන් වහන්සේ මෙහි ගෙනා ඒ ථේරවාදී ධර්මය උන්වහන්සේ හෙළ දිව් බසින් දේශිත බව සඳහන් වී තිබේ.[1] එවක ලංකාවේ සියබස වූයේ මෙහි ව්‍යවහාරීය භාෂාවයි. එම භාෂාව ද ප්‍රාකෘත විශේෂයක් කොට භාෂා වියත්හු සලකති. මෙරට ඉපැරණි ලේඛන එම ප්‍රාකෘත බසින් ලියැවී තිබෙන බව අද අපවිසින් පිළිගත යුත්තකි.

''දමරකිතතෙරශ අගත අනගත චතුදිශ සගශ'' මේ එවක ලේඛනගත සිංහල ප්‍රාකෘත භාෂාවේ වැකියකි.[2] මේ වැකිය දෙස පරීක්ෂා කර බලන විට එවක පැවැති ප්‍රාකෘත සිංහලය ස්වරවත්ව හල් අකුරු හා මහාප්‍රාණ නොමැතිව පිලි රහිතව පැවැති බව පෙනේ. මෙවැනි භාෂාවකින් ත්‍රිපිටකය වැනි ගැඹුරු ධර්මයක් පවත්වා ගත හැකි ද යන ප්‍රශ්නය බොහෝ වියතුන්ගේ සැලකිල්ලට දැන් භාජනව පවතී.

සෑම විටක ම සෑම රටක ම ලිඛිත භාෂාවත් ව්‍යවහාර භාෂාවත් අතර භේදයක් පවතී. ලිඛිත භාෂාව ව්‍යාකරණයට හුරුව ඇති අතර, ව්‍යවහාර භාෂාව ව්‍යාකරණවලින් තොරව පවතින බව අපට ප්‍රත්‍යක්ෂයි. ඒ තතු අද වුවත් ව්‍යවහාර හා ලිඛිත භාෂාව ගැන පරීක්ෂා කර බලන විට මැනවින් පෙනී යන්නකි. මේ කරුණ කෙසේ වුවත්, මහාවංස පුවතෙහි එන පරිදි මිහිඳු මහ රහතන් වහන්සේ විසින් පාලි ධර්මය සිංහල හෙළ බසින් පැවසූ පුවතෙහි සත්‍යයක් නැතැයි කිව නොහැකිය. භාෂාවේ තතු කොයිහැටි වුවත්, එදා මිහිඳු මාහිමියන් ගෙනා පාලි ධර්මය මෙරට භාෂාවට පරිවර්තනය වූ බවෙහි සැකයක් නැත.[3] මිහිඳු කාලය ඉක්ම තව කලක් ගත වූ විට, තුන්පිටකයෙහි ඇති සූත්‍ර

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කොටසක් පවා සිංහල වූ පුවත මහාවංසයෙහි දැක්වේ. මේ අනුව බුද්ධ ධර්මයෙහි සැහෙන කොටසක් ක්‍රිස්තු 4 වන සියවස පමණ වන විට සිංහල වී තිබුණු බව පිළිගත යුත්තකි.[4]

බුදු සමයෙහි ථෙරවාදයට වඩා **මහායානය** ශීඝ්‍ර දියුණුවක් ලැබුවකි. මනුෂ්‍ය ජීවිතයේ විවිධ පැති කරා ගමන් ගත් ක්‍රමයක් මහායාන බුදු දහමෙහි වූ හෙයින්, ඒ තත්ත්වය ඇති වී තිබේ. එහි දී සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයත් සමග ථෙරවාද – මහායාන දෙමග සසඳා බලන විට, ථෙරවාදයෙහි පටු බවක් පෙනී යන අතර මහායානයෙහි පෘථුලත්වයක් ඇතිව තිබූ බව බැලූ බැල්මට වුව ද දර්ශනය වේ. බොහෝ දෙනාගේ හිත කය මේ නිසා මහායාන මග වෙත මෙහෙයැවෙන්නට ඇත. එය කොතරම් පෘථුලව පැවතුනත් පෘථග්ජන මනුෂ්‍යයාගේ ඓහලෞකික සැපයට හිතකර වුවත් ථේරවාදීහු මහායාන මහ හැම විටකම හෙලා දුටුහ.[5] භාරතයෙහි ථේරවාදය යටපත්ව මහායානය ඉස්මතු වූ වේලාවක බුදුගොස් හිමියන් මෙහි වැඩම කර ථේරවාදී බුද්ධ ධර්මය එහි පතල කරවීමට දැරූ ප්‍රයත්නය මේ කරුණෙහි ලා අමතක කළ නොහේ.

බුදුගොස් හිමියන් ඇරඹූ ව්‍යාපෘතිය පාලි සාහිත්‍යයේ ඊළඟට ඇති වූ නව නැම්මක් සේ අපට පෙනේ. පාලි සාහිත්‍යය පුදුමාකාරයෙන් ලංකාවේ දියුණුවට පත්ව ගියේ ඊට පසුවයි. එම තත්ත්වය නිසා සිංහල භික්ෂූන් අතර පවා ස්වකීය භාෂාව වූ සිංහලය අමතකවීමට ගියා සේ පෙනේ. ථෙරවාදී බුදු දහමෙහි උච්චස්ථානය ලංකාවේ තරම් තවත් තැනක එදා නොපැවති බව පෙනී යයි. මෙරට මහාවිහාරීය සියලුම භික්ෂූන් වහන්සේලා ඒ ථෙරවාදී ධර්මයෙහි හික්මුණාහ.

මිහිඳු කාලයේ පැවැති ඉගෙනීම වාචෝද්ගත කිරීම මුල්කොට පැවතිණ. මෙරට ඇතිව ගිය මහා දුර්භික්ෂය රටේ කාගේත් කාය ශක්තිය හා ඥාන ශක්තිය හීන කරවා ඇත. කට පාඩමින් ගෙනා දේ ලේඛනගත කරවීමට සිදු වූ කරුණ ඒ බව අපේ ඉතිහාසයෙහි දැක්වේ.[6] වාචෝද්ගත කිරීම සඳහා නිශ්චල පරිසරය අත්‍යවශ්‍ය වූවකි. මේ නිසා භික්ෂු නිවාසයට යාබද **කුටි** ඇතිවිය. මේ කුටි මේ රටේ පැනෙන අධ්‍යාපනයෙහි ප්‍රථම සංස්ථාවක් සේ සැලකිය හැකියි. මේ කුටි ඉගෙණීම, ඉගැන්වීම සඳහාත් භාවනාව සඳහාත් වෙන්ව තිබුණු බව පෙනේ. ඒ ස්ථාන **පිරිවෙන්** හැටියට මිහිඳු කාලයේ සිටම නම් ගැනී ඇත.[7] භික්ෂු නිවාසයත් පිරිවෙනත් එකම බව ද එහි ලා පෙනී යන කරුණකි.[8] ඉගෙනීම එක් පැත්තකින් දියුණුවත්ම, භාෂාව තවත් පැත්තකින් වැඩි දියුණු විය. මේ නිසා පැරණි ලංකාවේ භික්ෂු සමාජයෙහි **ග්‍රන්ථ–විදර්ශනා** යනුවෙන් ධුර දෙකක් ඇතිවී තිබේ.[9] ග්‍රන්ථ ධුරය පිරූ භික්ෂූන් ගම්බදවත් විදර්ශනා ධුරය පිරූ භික්ෂූන් වනගතවත් වාසය කර ඇත. භික්ෂු අධ්‍යාපනය එවක දෙමගකට යොමු ව තිබූ හැටි එයින් දැක්ක හැකියි.

මහාවංසය ලියූ අවස්ථාව වන විට වියත් භික්ෂූන් වහන්සේලා විසූ විහාරාරාම නිවාස ප්‍රසිද්ධ පිරිවෙන් හැටියට පරිවර්තනය වී තිබේ. ලංකාවේ පිරිවෙන් ඉතිහාසයෙහි දීර්ඝ ගමන ගැන සොයන විට මෙතරම් පැරණි අධ්‍යාපන ආයතනයක් ලෝකයේ තවත් තැනක නොතිබුණා සේ පෙනේ. එහෙයින් පිරිවෙනේ උපත ලංකාවට අයත් බව අප අමතක කළ යුතු නොවේ.

පිරිවෙන් ආයතනය මෙරට භික්ෂු සමාජය මෙන්ම ගිහි සමාජය ද හැඩගැස් වූ තැන විය. විශේෂයෙන් වියත් භික්ෂු පිරිසේ දහම් හැදෑරීමට උපයෝගී වූ ස්ථානය මේ පිරිවෙනයි. අනුරාධපුර අවසාන කාලයෙහි මෙරට භික්ෂූන්ගේ තොරතුරු විමසන විට මෙහි ඇතිව තිබූ පිරිවෙන් ගණන සියයකට අධික බව පෙනේ. එම පිරිවෙන්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

බහුල වශයෙන් නම් ගෙන තිබුණේ ඒවා කරවා තිබූ සූයින්ගේ නාමයන්ගෙනි. මහාවංසය සකස් කළ මාහානාම හිමියන් වැඩ විසූ විහාරය ද එබඳු ස්ථානයකි. එම පිරිවෙන **දික්සඳ සෙනෙවියා** නමින් මහා වංසයෙහි ලිඛිතව ඇත. එය දෙවන පෑතිස් රජු දින විසූ ඇමතිවරයකුගේ නාමයක් කොට සැලකේ.[10] මිටපසු අවස්ථාවල දී මේ රටේ යම්කිසි පඩි පරපුරක් ඇතිව ගියේ නම් ඒ සියලු පඬිවරුන්ගේ අධ්‍යාපන ආයතනය පිරිවෙනම මුල්කොට වූ බව මැනවින් දර්ශිතය. වියත් භික්ෂූන් වැඩ විසූ ස්ථාන හැටියට **අට මහ වෙහෙරක්** ලංකා ඉතිහාසයෙහි සඳහන්ව එයි.[11] පසු කල **අෂ්ටායතන** හැටියටත්, **වියත්පත් අටගණය** හැටියටත් අපේ පොත්පත්වල සඳහන්ව එන්නේ මේ අට මහ වෙහෙරදැයි සිතා බලනු වටී.[12] අෂ්ටායතන යන වචනය සංස්කෘත හුරුවක් ගත් අතර, වියත්පත් අට ගණය ඒ සංස්කෘත වචනයේ සිංහල හුරුව බව දැක්වෙයි. පුදුමාකාරයෙන් දියුණුව මෙරට පැවතුණු එකම අධ්‍යාපන ආයතනය පිරිවෙන හැටියට දඹදෙණි කාලය පෙන්නුම් කළ හැකිය. **සිදත් සඟරාව** වැනි පොත් පහළ වූයේ එම පිරිවෙන්වල වැඩ විසූ මහ වියතුන්ගෙනි. තව ද, එවක, භික්ෂු නිවාසයට යාබද ස්ථානයක් ළදරු අධ්‍යාපනය සඳහා පැවතුන බව පෙනේ. ඒ වනාහි **පල්ලියයි.** සංස්කෘත භාෂාවේ එම පල්ලි යන වචනය අධ්‍යාපන ආයතනයක් බව පෙන්වාලයි.[13] පෘතුගීසීන් මෙහි පැමිණෙන විට ළමා අධ්‍යාපනය භික්ෂු නිවාසයට යාබදව පැවති පල්ලියෙහි තිබුණ හෙයින්, ඔවුන්ගේ දේවස්ථානයට ළමයින්ගේ අධ්‍යාපනය සඳහා මේ පල්ලිය ගෙන යන ලදී. ක්‍රිස්තියානි දේවස්ථානය පල්ලිය නමින් හැඳින්වීමට පටන් ගත්තේ මීට පසුවයි.

මෙසේ ඇති වූ පිරිවෙන ශීඝ්‍ර දියුණුවකට පත් වූ හැටි කෝට්ටේ යුගයේ පිරිවෙන් ඉතිහාසයෙහි දැක්වේ. **හංස සන්දේශය** හා **ගිරා සන්දේශය** කියවා බැලූ විට ලංකාවේ පැවති ප්‍රසිද්ධ පිරිවෙන් දෙකක තතු පැහැදිලි කර ගත හැකියි.[14] **තොටගමුවේ විජයබා පිරිවෙන** හා **කැරගල පද්මාවතී පිරිවෙන** ඒ පිරිවෙන් දෙකයි. ඒ දෙපොළ මෙරට අධ්‍යාපනයෙහි උසස්ම තැන ගත්තේ වන. එදා සමාජයට අවශ්‍ය සියලුම අධ්‍යාපන ඉගැන්වීම් එම පිරිවෙන් මගින් කර ඇත. එහි විශේෂය, විජයබා පිරිවෙන ග්‍රාමායතනය බැබලවීමත් පද්මාවතී පිරිවෙන අරණ්‍යායතනය බැබලවීමත්ය. මේ පිරිවෙන් දෙක එදා තරගයක යෙදී සිටියා සේ පෙනේ. ඒ අවස්ථාව වන විට පැවිදි පිරිස මෙන්ම ගිහි පිරිසක් ද පිරිවෙන් අධ්‍යාපනයෙන් පෝෂණය ලබා තිබුණි. මෙහි ලා සැලකිය යුතු දෙයක් නම්, මේ පිරිවෙන්වලින් ස්ත්‍රීන්ට සුදුසු අධ්‍යාපනයක් දී ඇත් ද යන්නයි. භික්ෂු අධ්‍යාපනය සවිස්තරවත් ගිහි අධ්‍යාපනය සාමාන්‍ය වශයෙනුත් දැක්වෙන අතර, ස්ත්‍රීන් පිළිබඳ අධ්‍යාපනය එතරම් පැහැදිලිවත් ප්‍රකටවත් එදා අපේ පිරිවෙන්වල පැවති බවක් නොදැක්වෙයි. ඒ එසේ වුවත්, **උලකුඩය දේවිය** කවියෙන් බණ අසනු රිසි ඇත්තක වූ හෙයින්[15] සිංහල කවියෙහි යම්කිසි ඇල්මක් රජගෙදර කාන්තාවන් අතර තිබූ බව පෙන්වා ලයි. එමගින් අපට සිතා ගත හැක්කේ එක්තරා ප්‍රමාණයක ස්ත්‍රී අධ්‍යාපනයකුත් මෙරට පැවැති අයුරුයි.

කෝට්ටේ යුගයෙන් පසු පෘතුගීසීන්ගේ අවතරණය නිසා පිරිවෙන නැවත වරක් යට වී ගොස් තිබේ. සම්පූර්ණයෙන්ම පිරිවෙන් අධ්‍යාපනය ඇණහිටි බව ලංකා ඉතිහාසයෙන් පෙනේ. 16–17 යන ශතවර්ෂ දෙකම මෙරට පිරිවෙන් අධ්‍යාපනයෙහි අඳුරු කාලයයි. ලංකා සමාජයේ අභිවර්ධනයට පිරිවෙනේ ඇති තතු දුටු වැලිවිට **සරණංකර සංඝරාජයන් වහන්සේ** 18 වන සියවසේ මේ පිරිවෙන් නැවත ඇති කිරීමට උත්සුක වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් **නියම කන්දේ විද්‍යාස්ථානය** ඇති වී තිබේ.[16] ඒ ආයතනය වනාහි අද මෙරට පවතින පිරිවෙන් අධ්‍යාපනයෙහි මුල්තැන කොට සැලකිය යුතුයි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ගිහි පිරිස් පිරිවෙනින් බිහිවන්නට පටන් ගැනුනේ සරණංකර සඟරජ හිමියන් ඇරඹූ ඒ විද්‍යාස්ථානය මගිනි. **අත්තරගම පඬිතුමා** වැනි ගිහි පඬිවරු රාජගුරු පදවියට පත්ව ආ යුගය මේ බව පෙනේ. එතැනින් ඇති වූ පිරිවෙන් අධ්‍යාපනයෙහි ඊළඟ වකවානුවෙහි කැපී පෙනුන මහ පඬිවරු නම්, **ගාල්ලේ මේධංකර, ඉඳුරුවේ සුමංගල, වලානේ සිද්ධත්ථ**, ආදී මහා සංඝයා වහන්සේලායි. උන්වහන්සේලා අනුගමනය කළ පිරිවෙන් මඟ අනුව **විද්‍යෝදය හා විද්‍යාලංකාර** දෙපිරිවෙන 19 වන සියවස අවසාන කාලයේ දී ඇතිවිය.[17] ඒ පිරිවෙන් දෙක ගිහි–පැවිදි භේදයක් නොතකා රටට අවශ්‍ය වියතුන් බිහිකළ ස්ථානයි. 19 වන සියවසේ අවසාන භාගයේ දී ඇති වූ මේ පිරිවෙන් දෙක මගින් ශාඛා ප්‍රශාඛා පිරිවෙන් ඇතිවීමෙන් 20 වන සියවසේ මුල් දසක කීපය තුළ දී පිරිවෙන ලංකාව පුරා පැතිරී ගියේය. මෙරට ඇති වූ ඒ පිරිවෙන් ගැන තොරතුරු විමසන විට අප දන්නා හැටියට ස්ත්‍රී අධ්‍යාපනයක් ඒ පිරිවෙන් මගින් බහුලව කෙරී නැති බව පෙන්වා දිය හැකියි. ඒ එසේ වුවත්, සම්භාව්‍ය උගතුන් හැටියට පැවිදි පිරිසට අමතරව බොහෝ ගිහි වියත්හු මේ පිරිවෙන් මගින් වැඩී ආහ. එහි ලා විශේෂයෙන් සිංහල වෙදවරුන්ගේ වර්තමාන සම්භවයට එම පිරිවෙන් උපස්තම්භක වී ඇති තරම, අපට අමතක කළ හැකි නොවේ. එය මෙරට තවත් තැනකින් නොසිදුවූවකි.

සිංහල වෙදකම්ට භාරතීය ආයුර්වේදය සම්බන්ධ වී තිබුණි. භාරත ආයුර්වේදය ඇතුළත් වූ පොත් පත් ගණය පැවතුණේ සංස්කෘත භාෂාවෙනි. ඒ නිසා සංස්කෘත භාෂාව ඉගෙනීම මේ රටේ අනිවාර්‍ය වී තිබේ. ඒ සංස්කෘත භාෂාව භාරතයෙහි හැරුණු විට මනා ලෙස ඉගැන්වූ එක ම රට ලංකාවයි. එ ද පිරිවෙන් මගින් කළ අධ්‍යාපනයකි. මේ කරුණෙහි දී සංස්කෘත, භාෂා අධ්‍යාපනය විශේෂයෙන් ආයුර්වේද අධ්‍යාපනය මේ රටේ පිරිවෙන් මගින් පෝෂණය ලත් තරම දත හෙයි. **මාධව, සාරසංක්ෂේප, සුශ්‍රැත, චක්‍රදත්ත, අෂ්ටාංගහෘදය** වැනි ඒ සකු මහ වෙද පොත් මෙහි භාවිතයට ආ හැටි දැනට අමතක වෙමින් පවතී. සකු වියරණ, ඡන්දස් අලංකාර හා කාව්‍යයන් ඇතුලු සකු සාහිත්‍යය ඉතා ඉහළින් ඒ පිරිවෙන් මගින් ඉගැන් වූ හැටි අපේ මතකයේ තාමත් පවතී. **හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර** වැනි පොත් සංස්කෘත ඉගැන්වීමෙහි මූලික පොත් හැටියටත් **රඝුවංශ, දශකුමාර චරිත** ඊළඟ අවස්ථාවේදීත්, **ශිශුපාලවධ, නෛෂධ චරිත, කාදම්බරි, වාසවදත්තා** වැනි පොත් පශ්චිම අවස්ථාවේදීත් පිරිවෙන් අධ්‍යාපන-යෙහි යොදා තිබුණි. මීට අමතරව **කාව්‍යාදර්ශ, සාහිත්‍ය දර්පණ** වැනි පොත් සාහිත්‍ය විවේචනයේද, **ශකුන්තලා, රත්නාවලී, නාගානන්ද** ආදිය නාට්‍ය විෂයේදී ද **ගීතගෝවින්ද** වැනි ගීත පොත් ද පිරිවෙන්වල භාවිත කෙරිණ. මේ නිසා, සිංහල පාලි, හැරුණුවිට, සංස්කෘත සාහිත්‍යය පෘථුල ලෙස ඉගැන්වීම ඒ පිරිවෙන් අධ්‍යාපනයෙහි ප්‍රමුඛ අංගයක් විය. මීට අමතරව, **ජාතකමාලා, සෞන්දරානන්ද කාව්‍ය** වැනි බෞද්ධ සංස්කෘත පොත් ද භාවිතයට පත් විය.

මෙම විසිවන සියවසේ මුල් දසක කිහිපය මෙරට පිරිවෙන් අධ්‍යාපනයේ ඒ උත්තරීතර අවස්ථාවයි. ඒ තතු රැක ගැනීමට මෙම සියවසේ මුල දී පිහිටුවාගත් **ප්‍රාචීන භාෂොපකාර සමාගමේ** ක්‍රියා කලාපය පිහිට වීය. එම සමාගම මෙරට තවත් අධ්‍යාපන ආයතනයකින් නොකළ තරමේ මහත් මෙහෙයක් මෙරට පිරිවෙන් අධ්‍යාපනයට සිදු කර ඇත.

19 වන සියවසේ අගභාගයේ දී පුනරුත්ථාපනයට පත් කළ පිරිවෙන් අධ්‍යාපනය ක්‍රමවත් ව සකස් කරවීමෙහි ලා ප්‍රාචීන භාෂොපකාර සමාගමින් ඇතිකළ විභාග පරි-පාටියත් එයින් උත්තීර්ණ වූ පිරිසට පිරිනැමූ **පණ්ඩිත උපාධියත්** වියත් ගිහි පැවිදි පිරිසක් මෙරට බිහි කරවීමෙහි ලා ගත් සදානුස්මරණීය ක්‍රියාපද්ධතියක් බව මෙරට

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ඉතිහාසයෙහි විනිවිද පෙනේ. සිංහල, පාලි, සංස්කෘත හා ඒ භාෂාවන්ට අදාල විෂය පද්ධතිය පිළිබඳ නොසෙල්විය හැකි පූර්ණ දැනුමක් එම අධ්‍යාපනය සම්පූර්ණ කළ පිරිසට ලැබී යෑම එහි අගය කළ යුතු තැනයි. ඒ වියත් පිරිස නියම උගතුන් හැටියට සම්භාව්‍ය තත්ත්වයකට පත්වී ඇත. විශ්ව විද්‍යාල උපාධි ලැබීමෙන් පිරිපුන්ව සිටි ගිහි–පැවිදි වියතුන් තුළ පැවති සමත්කම, පිරිවෙන් අධ්‍යාපනයෙන් බැබලී සිටි මහ වියතුන්ගේ ඇසුරින් ලද ආභාසය බව හංගාලිය හැකි දෙයක් නොවේ. මේ විසිවන සියවසේ ජාත්‍යන්තර කීර්තියක් ලත් මේ රටේ විසූ වියත් ගිහි පිරිස් අතර. **ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, ඩබ්. ඇෆ්. ගුණවර්ධන, මැන්දිස් ගුණසේකර, ගුණපාල මලලසේකර, සෙනරත් පරණවිතාන, ඩී. ඊ. හෙට්ටිආරච්චි** වැනි සම්භාව්‍ය පිරිස පිරිවෙන් අධ්‍යාපනයෙන් වැඩී සිටි මහ වියත් තෙරවරුන් ඇසුරු කිරීමෙන් ස්වකීය වියත්කම් ලොවෙහි පූජිත භාවයට පත්කර ගත් බව ප්‍රසිද්ධ කාරණයකි. මෙරට ගිහි පිරිස එබඳු ජාත්‍යන්තර කීර්තියට පත් කරවීමෙහි ලා උපස්තම්භක වූ මහ වියත් භික්ෂු පිරිස් අතර **හික්කඩුවේ සුමංගල, රත්මලානේ ධර්මාරාම, වස්කඩුවේ සුභූති, පොල්වත්තේ බුද්ධදත්ත, විදුරුපොළ පියතිස්ස, කොත්මලේ ධම්මානන්ද, යගිරල පඤ්ඤානන්ද, වැලිවිටියේ සෝරත** වැනි පිරිවෙන් අධ්‍යාපනයෙන් ලංකාව වියත් ලොවෙහි උස් තැනකට නංවා ලූ භික්ෂූන් වහන්සේලා වූහ. උන්වහන්සේලාගේ වියත්කම්හි උපතට පිරිවෙනත් ප්‍රාචීන භාෂොපකාර සමාගමත් එකසේ පිහිට වී ඇත. ඒ නිසා පිරිවෙන මෙරට වියතුන් ගැන තොරතුරු විමසීමක දී අමතක කරනු බැරි තැනක් වනු ඇත.

සමාජයේ ඉදිරිය කරා ගමන් ගත් ඝිපදෙනකුට හැර, පිරිවෙන් අධ්‍යාපනය ලැබ ප්‍රාචීන පණ්ඩිත උපාධිය ලත් පිරිස් වෙත මේ රටේ උගතුනට ලැබිය යුතු තැන මෙතාක් නොදීම කණගාටුවකට කරුණක් සේම බරපතල වරදකි. ඔවුන්ගේ මානව අයිතිය නොතකා හැරීමකි. පාලනයෙහි නියුතු පිරිස් එම උගතුන් විශ්ව විද්‍යාලයක උපාධි ගත් කෙනෙකුගේ තත්වයෙනුත් පහතින් සැලකීම, දේශීයත්වය ගැන මේ රටේ වගකිව යුතු පිරිස් එදා සිට මේ දක්වා දරණ හීනමාමක ගතිය පිළිබිඹු කරවා සිටී. විදේශ හුරුව තවමත් කරපින්නා ගෙන සිටින එම පිරිසෙන් මේ උගතුන්ට සිදු වී තිබෙන විපත, තවමත් මග හරවාගත නොහැකි තත්ත්වයක පවතී. නියම උගත්කමකින් දේශීය සංස්කෘතිය රැක ගෙන එන ඒ පිරිස සඳහටම කොන්කර තැබීමට කාලය විසින් ඉඩ නොදීමට නම් දැනට වැටෙමින් යන පිරිවෙන නගාලීමට පිරිවෙන් කරන පිරිස සංවිධානාත්මකව කටයුතු සලස්වා ගැනීම කළ යුතු දෙයක් සේ පෙනේ.

**පාදක සටහන්:**

1. ``දෙතැනෙක්හිදී හෙළදිව් බසින් දහම් වදාරා``–මහාවංස 14. පරි. 65 ගාථාව.
2. වෙස්සගිරි සෙල් ලිපි පාඨයකි–ලංකා ශිලාලේඛන සංග්‍රහය. 1. 18 පිට.
3. චුල්ලහත්ථි පදෝපම, සමචිත්ත, ආසිවිස, ගෝමය පිණ්ඩික, අග්ගික්ඛන්ධොපම, ධම්ම චක්ක පවත්තන. දේවදූත යන සූත්‍ර ධර්ම ගණනාවක් ද පේතවත්ථු, විමානවත්ථු හා සච්ච සංයුත්තය ද මිහිඳු මහ රහතන් වහන්සේ විසින් දෙසූ බව සඳහන්ය. මහාවංස 13–18 පරිච්ඡෙද. මේ දේශනා හෙළ බසින් ම කර ඇති බවට සැකයක් නැත.
4. බුද්ධදාස රජු දින මහාධම්මකථී මහ තෙරුන් විසින් සූත්‍ර පිටකය හෙළ බසට නැඟූ බවට ඉඟිදෙන සටහනක් මහාවංස (37 පරි.) යෙහි එයි.
5. ලංකාවේ මහායාන ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි සංක්ෂිප්ත සටහනක් සිංහල සාහිත්‍ය වංශයේ 21–27 පිටු අතර එයි. විස්තර සඳහා ලක්දිව මහායාන අදහස් 27, 28 පරි. බලන්න.
6. මහාවංස 33 පරි.
7. මිහිඳු හිමියන් මෙහි වැඩම කළ පසු එවැනි කුටි (ලෙන්) සැට අටක් කන්තක චෛත්‍යය අවට පමණක් තිබූ බව වාර්තාවෙයි. මහාවංස. 33 පරි. 12 ගාථා.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

8. කාලප්‍රසාද, සුන්භාත, දීසවඩ්කමණ, එලග්ග, මරුගණ ආදි බොහෝ පිරිවෙන් ද පසු කල මහාවංසය කළ මහානාම හිමියන් විසූ දික්සඳ සෙනෙවියා පිරිවෙන ද මිහිඳු කාලයේම ඇති වී තිබේ. මහාවංස 15 පරි.
9. ග්‍රන්ථ–විදර්ශනාධුර පිළිබඳ පැහැදිලි සංක්ෂිප්ත සටහනක් සිංහල සාහිත්‍ය වංසයේ 20 පිටේ එයි.
10. මෙහි 7 වන අධෝ ලිපිය බලන්න.
11. මහාවංස 32 පරි. 42 ගාථා.
12. අෂ්ටායතන ගැන පැහැදිලිවූත් සංක්ෂිප්තවූත් සටහනක් සිංහල සාහිත්‍ය වංසයෙහි 28–29 පිටුවල එයි: වියත්පත් අටගණය නිකාය සංග්‍රහ 19 පිට.
13. ''කොසොල් රජ්ජුරුවන් හා බාල කල එක පල්ලියේ දී ශිල්ප උගන්නා විශ්වාසයෙන්'' පූජාවලිය. 355 පිට. සංස්කෘත පල්ලි වචනයෙහි විවිධ තේරුම් ඇත. ඉන්දියානු භාෂා ගණයකට ඒ වචනය පිවිස ගෙන ඇත. සංස්කෘත ඇතුළත් මරාටි ආදි ඉන්දියානු භාෂා ශබ්දකෝෂ බලන්න. පසුව ද්‍රවිඩ භාෂා ගණයට ද මේ වචනය ඇතුළත් වී තිබේ.
14. ගිරා සන්දේශය 219–227
හංස සන්දේශය 172–184 කවි බලන්න.
15. කාව්‍යශේඛර 1–22
16. සංඝරාජ සාධු චරියාව. 10 පිට.
17. විද්‍යෝදය පිරිවෙන 1872 දී, විද්‍යාලංකාර පිරිවෙන–1875 දී.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk